# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2301/55 - 2022 ඔක්තෝබර් මස 14 වැනි සිකුරාදා - 2022.10.14

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව**

නිවේදනය

2022 ජූලි මස 22 වැනි දිනැති අංක 2289/43 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද නිවේදනය මගින්, ගරු ජනාධිපතිතුමා විසින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 වැනි ව්‍යවස්ථාවේ (1) (අ) අනු ව්‍යවස්ථාව යටතේ මා වෙත පවරා ඇති විෂයයන් හා කාර්යයන්, දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත ආයතන සහ ක්‍රියාත්මක කළ යුතු නීති හා අණ පනත් අතරින් පහත උපලේඛනයේ සඳහන් දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත ආයතන සහ ක්‍රියාත්මක කළ යුතු නීති හා අණ පනත්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 45(4) ව්‍යවස්ථාව මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව 2022.09.28 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි ගරු සෞඛ්‍ය රාජ්‍ය අමාත්‍යතුමිය සහ ගරු දේශීය වෛද්‍ය රාජ්‍ය අමාත්‍යතුමා වෙත පවරනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ආචාර්ය **කෙහෙලිය රඹුක්වැල්ල,**
සෞඛ්‍ය අමාත්‍ය.

2022 ඔක්තෝබර් මස 05 වැනි දින.

**සෞඛ්‍ය රාජ්‍ය අමාත්‍ය**

| *දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා* | *ක්‍රියාත්මක කළ යුතු නීති සහ අණ පනත්* |
|---|---|
| 1. වෛද්‍ය රසායනාගාර තාක්ෂණ පාසල<br>2. පෞද්ගලික වෛද්‍ය නියාමන සභාව<br>3. ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහල<br>4. විජය කුමාරතුංග අනුස්මරණ රෝහල<br>5. දුම්කොළ සහ මධ්‍යසාර පිළිබඳ ජාතික අධිකාරිය<br>6. 1990 සුවසැරිය පදනම | ● පෞද්ගලික වෛද්‍ය ආයතන (ලියාපදිංචි කිරීමේ) පනත (2006 අංක 21)<br>● ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහල් මණ්ඩල පනත (1983 අංක 54)<br>● විජය කුමාරතුංග අනුස්මරණ රෝහල් මණ්ඩල පනත (1999 අංක 38)<br>● දුම්කොළ සහ මධ්‍යසාර පිළිබඳ ජාතික අධිකාරී පනත (2006 අංක 27)<br>● 1990 සුවසැරිය පදනම පනත (2018 අංක 18) |

**දේශීය වෛද්‍ය රාජ්‍ය අමාත්‍ය**

| *දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා* | *ක්‍රියාත්මක කළ යුතු නීති සහ අණ පනත්* |
|---|---|
| 1. ආයුර්වේද දෙපාර්තමේන්තුව<br>2. ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව<br>3. ආයුර්වේද වෛද්‍ය සභාව<br>4. ආයුර්වේද විද්‍යාල සහ ආරෝග්‍යශාලා මණ්ඩලය<br>5. ආයුර්වේද ශික්ෂණ හා පර්යේෂණ රෝහල්<br>6. හෝමියෝපති වෛද්‍ය සභාව<br>7. හෝමියෝපති රෝහල වැලිසර | ● ආයුර්වේද පනත (1961 අංක 31)<br>● හෝමියෝපති පනත (1970 අංක 07) |

EOG 10 - 0121

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.